## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි/ උද්‍යාන කම්කරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

**01. සම්බන්ධවන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව :- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
යොමු අංකය :- විවැ/පා5/2014/බඳවා ගැනීම් දිනය :- 2019.06.26

1.2 අමාත්‍යාංශය :- රාජ්‍ය පරිපාලන්, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන -අමාත්‍යාංශය
යොමු අංකය :- Pns/P8/02/04 දිනය :- 2019.08.02

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය :- DMS/C3/3/30/01 දිනය :- 2012.02.03

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය :- EST-2/RECRU/03/1812 දිනය :- 2014.10.03

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය :- NPC/6/25/089/SR දිනය :- 2014.06.27

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය :-PSC/EST/05-01-25/03/2019 දිනය :-2019.01.28

**02. පත් කිරීම් බලධාරියා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය :- ප්‍රාථමික අර්ධ ශිල්පීය

3.2 ශ්‍රේණි :- 111, 11, 1, විශේෂ

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :-

ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවැනි හෝ තුන්වැනි මට්ටමේ ප්‍රවීනතා/ කාර්මික නිපුණතාවන් අවශ්‍ය වන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් ඒ ඒ තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය** :- ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

**05. වැටුප්**

5.1 වැටුප් කේත අංකය :- PL 2 – 2016
5.2 වැටුප් පරිමාණය :- රු.25,250-10x270-10x300-10x330-12x350-38,450/=
5.3 විශේෂ ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය |
|---|---|---|
| III | පියවර 01 | රු.25,250/= |
| II | පියවර 12 | රු.28,250/= |
| I | පියවර 22 | රු.31,280/= |
| විශේෂ | පියවර 32 | රු.34,600/= |

**06. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අරක්කැමි/ උද්‍යාන කම්කරු | III, II, I, විශේෂ | 04 | **අරක්කැමි :-**<br>i. නවාතැන්කරුවන්ගේ ඉල්ලීම් වලට අනුව ආහාර වට්ටෝරු පිළියෙල කර දීම<br>ii. මුළුතැන්ගෙය පිරිසිදුව හා ක්‍රමානුකූලව නඩත්තු කිරීම හා එහි උපකරණ ආරක්ෂා කිරීම<br>iii. තනතුරට අදාළව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි කටයුතු<br><br>**උද්‍යාන කම්කරු :-**<br>i. දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන නිවාඩු නිකේතන භූමිය භාරව කටයුතු කිරීම.<br>ii. නිකේතන භූමිය නඩත්තු කිරීම හා අලංකාරව තබා ගැනීම<br>iii. තනතුරට අදාළව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි කටයුතු |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- අරක්කැමි/ උද්‍යාන කම්කරු - 04

"ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැළකේ."

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් :-

තනතුරෙහි කාර්යභාරයට අදාළ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන (02) මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම.

7.2.2.3. පළපුරුද්ද :- විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

7.2.2.4. කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5. වෙනත් :-

i. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.
ii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවු: 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවු: 45 ට නොවැඩි

(රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| 2. තනතුරට අදාළ පළපුරුද්ද | 25 | |
| 3. අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 | |
| 4. තනතුරට අදාළ වෘත්තීය දැනුම | 25 | |
| 5. භාෂා ප්‍රවීණතාවය | 05 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| **එකතුව** | 100 | |

<u>සටහන</u>

1. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

2. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

3. තනතුරට අදාළ වෘත්තීය දැනුම මැන බැලීම සඳහා සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේදී තනතුරට අදාල කාර්යයන් සම්බන්ධයෙන් වාචික ප්‍රශ්න ඉදිරිපත් කර වෘත්තීය දැනුම පරීක්ෂා කරනු ලැබේ.

7.2.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා: විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය. ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | වාචික සම්මුඛ පරීක්ෂණයකි. ඇමුණුම I |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | වාචික සම්මුඛ පරීක්ෂණයකි. ඇමුණුම II |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | වාචික සම්මුඛ පරීක්ෂණයකි. ඇමුණුම III |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද : විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

## 09. භාෂා ප්‍රවීණතාව

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 සේවා ගණයෙහි III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම

II. සේවා ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම, සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11. තනතුරු වලට පත් කිරීම: අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

"සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුලත්, නිලධාරියකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන - අදාළ නොවේ.

සකස් කළේ :

එස්. ජී. සී. කේ. බණ්ඩාර
පරිපාලන නිලධාරී
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත, කොළඹ 10.

පරීක්ෂා කළේ :

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)
කුෂානි බොරලැස්ස
අධ්‍යක්ෂ (පාලන) - වැ.බ.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ - 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :

24/06/2020

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :
තනතුර :
නිල මුද්‍රාව :

ඒ. ජගත් ඩී. ඩයස්
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

දිනය :

යොමු අංකය: PMS/PB/02/04

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019/01/22...... දින අනුමත කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (අරක්කැමි/ උද්‍යාන කම්කරු තනතුර) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :

නම :

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දිනය : 2020/07/21

නිල මුද්‍රාව :

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

යොමු අංකය: PSC/EST/05-01-85/03/2019

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (අරක්කැමි/ උද්‍යාන කම්කරු තනතුර) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය 2019.01.28 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :

නම : එම් . ඒ . බී . දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2020.08.21

නිල මුද්‍රාව :

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

ඇමුණුම - I

<u>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

1. පරීක්ෂණයේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි/ උද්‍යාන කම්කරු තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| උද්‍යාන කම්කරුගේ/ අරක්කැමිගේ මූලික රාජකාරි පිළිබඳ අවබෝධය | 25 | 40 |
| දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව සාමාන්‍ය දැනීම | 20 | |
| මුළුතැන්ගෙය ක්‍රමානුකූලව නඩත්තු කිරීම/ බංගලාව අවට පරිසර අලංකරණය | 30 | |
| බංගලාවෙහි/ මුළුතැන්ගෙයහි තිබෙන භාණ්ඩ නඩත්තුව පිළිබඳ දැනුම | 25 | |

3. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

සකස් කළේ :

අත්සන :

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

එස්. ජී. සී. කේ. බණ්ඩාර
පරිපාලන නිලධාරී

නම : විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,

තනතුර : මාලිගාවත්ත [illegible]

දිනය : 2020. 06. 29

පරීක්ෂා කළේ :

අත්සන :

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

කුෂානි බොරලැස්ස
අධ්‍යක්ෂ (පාලන) - වැ.බ.

නම : විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

තනතුර : මාලිගාවත්ත, කොළඹ - 10.

දිනය : 2020 . 06 . 29

අත්සන : 29/06/2020

( දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : ඒ. ජගත් ඩී. ඩයස්

තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

දිනය :

නිල මුද්‍රාව :

ඇමුණුම - II

<u>**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**</u>

1. පරීක්ෂණයේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි/ උද්‍යාන කම්කරු තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| දෙපාර්තමේන්තු කාර්යය, ආයතන හා කාර්යය පිළිබඳ දැනුම | 20 | 40 |
| ශිල්පීය දැනුම | 20 | |
| මුළුතැන්ගෙය නඩත්තු කිරීම පිළිබඳ අවබෝධය/ උද්‍යානය සකස් කිරීම පිළිබඳ අවබෝධය | 20 | |
| මුළුතැන්ගෙය පවිත්‍රව තබා ගැනීම/ පරිසර අලංකරණය | 20 | |
| උපකරණ භාවිතය හා නඩත්තුව | 20 | |

3. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

සකස් කළේ :

අත්සන :

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

එස්. ජී. සී. කේ. බණ්ඩාර
පරිපාලන නිලධාරී
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

නම :

තනතුර :

දිනය : 2020.06.29.

පරීක්ෂා කළේ :

අත්සන

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

කුෂානි බොරලැස්ස
අධ්‍යක්ෂ (පාලන) - වැ.බ.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ - 10.

නම

තනතුර :

දිනය : 2020.06.29

අත්සන : 29/06/2020

( දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : ඒ. ජගත් ඩී. ඩයස්

තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

දිනය :

නිල මුද්‍රාව :

**<u>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>**

1. පරීක්ෂණයේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි/ උද්‍යාන කම්කරු තනතුර සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සංවිධාන ව්‍යුහය පිළිබඳ අවබෝධය | 25 | 40 |
| ආහාර පිළියෙල කිරීම පිළිබඳ දැනුම/ ගෙවතු වගාව පිළිබඳ දැනුම | 25 | |
| විවිධ සූපවේද ක්‍රම පිළිබඳ දැනුම/ මල් හා විසිතුරු සැරසිලි පිළිබඳ අවබෝධය | 20 | |
| මුළුතැන්ගෙය මනාව නඩත්තු කිරීම/ උද්‍යානය අලංකරණය | 15 | |
| ඉංග්‍රීසි භාෂාව හා දෙමළ භාෂාව පිළිබඳ සරල වාචික දැනුම | 15 | |

3. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

සකස් කළේ :

අත්සන :

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

එස්. ජී. සී. කේ. බණ්ඩාර
පරිපාලන නිලධාරී

නම : විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
විශ්‍රාම වැටුප් [illegible]

තනතුර : මාලිගාවත්ත, [illegible]

දිනය : 2020.06.29.

පරීක්ෂා කළේ :

අත්සන :

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

කුෂානි බොරලැස්ස

නම : අධ්‍යක්ෂ (පාලන) - වැ.බ.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

තනතුර : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ - 10.

දිනය : 2020.06.29

අත්සන : 29/06/2020

( දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : ඒ. ජගත් ඩී. ඩයස්

තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

දිනය :

නිල මුද්‍රාව :